සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....................................

## 52 නර්තනය (දේශීය) - I

කාලය පැය 02 යි

- අංක 01 - 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.
- උපදෙස් :- මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

---

01. කාව්‍යකරණයේදී සඳැස්මත් යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) ලඝු හා ගුරු මාත්‍රාවල එකතුවයි.
(2) ලඝු අක්ෂරවල එකතුවයි.
(3) ලඝු හා ගුරු අක්ෂරවල එකතුවයි.
(4) ලඝු මාත්‍රා හා හල් අක්ෂරවල එකතුවයි.
(5) ගුරු මාත්‍රා හා හල් අක්ෂරවල එකතුවයි. (.........)

02. දේශීය නර්තන සම්ප්‍රදායන් හී විවිධ 'පැනීම්' හා ' කැරකීම් ' ක්‍රම ශිල්ප අතර මාලක්කම, ආසුව, පතහවිස්ස යන කැරකීම් දක්නට ලැබෙන්නේ,
(1) උඩරට නර්තන සම්ප්‍රදායේ ය (2) සබරගමු නර්තන සම්ප්‍රදායේ ය
(3) පහතරට නර්තන සම්ප්‍රදායේ ය (4) උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායේ ය
(5) පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායේ ය (.........)

03. වන්නමෙහි ප්‍රස්තුතයට අදාලව තාල රූප භාවිතය උඩරට වන්නම් හි ගුණාංගයකි. තාල රූප දෙකක් භාවිතා වන වන්නමකි,
(1) නෛඅඩි (2) මුසලඩි (3) උකුසා (4) වෛරොඩි (5) අසදෘශ (.........)

04. ජස කෝලමෙහි යොදා ගන්නා ' ගුම් දැහිම් ගුද ගුද දැහිම් ' ....... යන බෙර පදය දහඅට සන්නියේ ද භාවිත වේ. එම අවස්ථාව වනුයේ,
(1) අඟුරු දුම්මල පාලිය යි. (2) සළු පාලිය යි. (3) කඩවත් තරණය යි.
(4) මරුවාගේ පැමිණීම යි. (5) මුගුරු පාලිය යි. (.........)

05. උඩරට මයුරා වන්නමෙහි තිතට සමානව ගයනු ලබන පහතරට සින්දු වන්නමකි,
(1) ලලිතරාග තාලය සින්දු වන්නම (2) කොණ්ඩනාවිංචි තාලය සින්දු වන්නම
(3) ශුද්ධ තාලය සින්දු වන්නම (4) නළුගීතිකා තාලය සින්දු වන්නම
(5) හනුමන්තා තාලය සින්දු වන්නම (.........)

06. බෙර පදයකට අයත් මාත්‍රා සංඛ්‍යාව දැක්වෙන්නේ,
(1) යති යනුවෙනි (2) ගති යනුවෙනි (3) ලය යනුවෙනි
(4) මිති යනුවෙනි (5) ජාති යනුවෙනි (.........)

07. දඹදෙණි යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍ර ලෙස හැඳින්විය හැක්කේ,
(1) මහා වංශය, සද්ධර්ම රත්නාවලිය, තිසර සංදේශය
(2) දඹදෙණි අස්න, කඳවුරු සිරිත, ථූපවංශය
(3) චූල වංශය, මහා වංශය, එළු අත්තනගලු වංශය
(4) සද්ධර්මරත්නාවලිය, උම්මග්ග ජාතකය, ථූප වංශය
(5) කව් සිළුමිණ, සඟ සරණ, මහා වංශය (.........)

08. පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දේශීය තාල පද්ධතිය පිළිබඳව ඒකමිතික මතයක් ගොඩ නැගීමට වඩාත් දායක වූ සංගීතඥයෙකු ලෙස හැඳින්විය හැක්කේ,
(1) ' තාල ඥාණ ' ග්‍රන්ථ කතුවර වින්සන්ට් සෝමපාල මහතා ය.
(2) ' නෘතය රත්නාකරය' ග්‍රන්ථ කතුවර ජේ. ඊ. සේදරමන් මහතා ය.
(3) ' සංගීත සම්භවය ' ග්‍රන්ථ කතුවර සී. ද එස්. කුලතිලක මහතා ය.
(4) 'හෙළ ගී මඟ ' ග්‍රන්ථ කතුවර ඩබ්. ඩී. මකුලොලුව මහතා ය.
(5) 'සිංහල නාට්‍ය ප්‍රදීපය' ග්‍රන්ථ කතුවර ජේ. ඊ. ගුණසේන මහතා ය. (.........)

09. බෙර සකස් කිරීම සඳහා ගන්නා ආයුධ අතර බෙර කඳ හැරීම සඳහා භාවිතා කරන උපකරණය වන්නේ, ,
(1) හරස් නියන, පොරව, උල් නියන (2) සාත්තුව, ඇලිස් නියන, බොකු නියන
(3) පෙති කටුව, පිහිය, දැව ඉල්ලම් (4) වෑය, අත් නියන, පුල්ලෝරම
(5) බොකු නියන, උල් නියන, පළල් නියන (.........)

10. ජිං කුද ගජිත කුදං - ගජිංත ගජිත කුදං ..........මෙම පද කොටස අයත් අඩව්ව නර්තනය කරනු ලබන්නේ,
(1) දොං ජිංත ගත දොංත වට්ටමේ ය (2) ගුද ගදිගත වට්ටමේ ය
(3) කුදංත ගත දොං වට්ටමේ ය (4) ගොග් ගොග් ජිං ජිංගත වට්ටමේ ය
(5) කුද කුජිගත වට්ටමේ ය (.........)

11. මුදලි කෝලමෙහි විලම්බව වැයෙන ' ගත ගුම් ............... යන පදය භාවිත වන වෙනත් නර්තන අංග කිහිපයක් දැක්වෙන්නේ,
(1) ශුද්ධ මාත්‍රය, මුගුරු පාලිය, ගිරි දේවි
(2) නඩන්දූව, පත්තිනි පද, දරු නැළවිල්ල
(3) දරු නැළවිල්ල, නාග කන්‍යා, ගිරි දේවි
(4) නේරංගම, නානුමුරය, නාග කන්‍යා
(5) ගුරුළු රාක්ෂ, ගිරිදේවි, ගරා යකා (.........)

12. උපන් පළමු එක්වර ඇති කරපු මවු මරා, අතින් කඩාගෙන පියයුරු බොමින් ලේ උරා.......
මෙම කවියෙන් විස්තර වෙන්නේ.
(1) කළු යකා (2) රීරි යකා (3) මරු යකා (4) සන්නි යකා
(5) ඔඩ්ඩි යකා (.........)

13. මාත්‍රා $2+2+2+4+4$ තාල රූපය භාවිත කරනු ලබන්නේ,
(1) පහතරට ශුද්ධ තාලය සහ සබරගමු මුල් මාත්‍රය සඳහා ය
(2) සබරගමු මුල් මාත්‍රය සහ උඩරට අස්නෙ සඳහා ය
(3) පහතරට ශුද්ධ මාත්‍රය සහ සබරගමු දේවකෝල්පාඩුව සඳහා ය
(4) උඩරට මංගලම් සහ පහතරට ශුද්ධ මාත්‍රය සඳහා ය
(5) සබරගමු මුල් මාත්‍රය සහ උඩරට මංගලම් සඳහා ය (.........)

14. දේශිය අමුද්‍රව්‍ය යොදා ගත් ආලේපන වලින් මුහුණ වෙස් ගන්වා සභාවට පිවිසෙන්නේ,
(1) මරු සන්නියයි (2) වෙඩි සන්නියයි (3) බිහිරි සන්නියයි
(4) ගොළු සන්නියයි (5) කණ සන්නියයි (.........)

15. ' වලියක් මංගල්‍යය විමසුම ' හා , ' සබරගමු නර්තන කලාව ' යන කෘති රචනා කරන ලද්දේ පිළිවෙලින්.
(1) මුදියන්සේ දිසානායක මහතා සහ ජයසේන කෝට්ටේගොඩ මහතා ය
(2) ජේ. ඊ. සේදරමන් මහතා සහ තිස්ස කාරියවසම් මහතා ය
(3) මුදියන්සේ දිසානායක මහතා සහ ලයනල් බෙන්තරගේ මහතා ය
(4) ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය සහ ජේ. ඊ. සේදරමන් මහතා ය
(5) මුදියන්සේ දිසානායක මහතා සහ ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය ය (.........)

16. දේශීය තාල පද්ධතියේ කුඩා මාත්‍රා සංඛ්‍යාවක් ඉදිරියටත්, වැඩි මාත්‍රා සංඛ්‍යාවක් පසුවටත් යෙදීමෙන් තාල රූප ගොඩ නැගෙන න්‍යායෙන් බැහැරව මාත්‍රා 3+2+2 වශයෙන් තාල රූපය යොදාගෙන ඇති අවස්ථාවකි,
(1) උඩරට මයුරා වන්නම (2) පහතරට ශුද්ධ තාලය සින්දු වන්නම
(3) උඩරට ගාහක වන්නම (4) සබරගමු කෝකිල වන්නම
(5) සබරගමු නාග ගජගා වන්නම (.........)

17. සළු පාලිය සහ මරු සන්නියේ දී උද්දීපනය වන රස වන්නේ,
(1) හාස්‍ය හා වීර රසය (2) බීභත්ස්‍ය සහ භයංකාර රසය
(3) හාස්‍ය සහ භයානක රසය (4) ශෘංගාර සහ වීර රසය
(5) ශාන්ත සහ භයානක රසය (.........)

18. කොහොඹා කංකාරිය, රට යකුම සහ සූනියම් යන ශාන්ති කර්මවලට අයත් නර්තනාංග අනුපිළිවෙලින් දැක්විය හැක්කේ,
(1) අස්නෙ, ආවැන්දුම , තෙල්මේ ය
(2) අස්නෙ, කපුයක්කාරිය, කඨාපහ ය
(3) අස්නෙ, යක් ඇනුම, ආවැන්දුම ය.
(4) අස්නෙ, කපුයක්කාරිය, වඩිග පටුන ය.
(5) අස්නෙ, දේවකෝල්පාඩුව, පත්තිනි පද ය. (.........)


19. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් විසින් රචිත නවතම වන්නම් තුනකි,
(1) යශෝදරා වන්නම, ආනන්ද වන්නම හා මරඟන වන්නම.
(2) සමන් දෙවි රූ වන්නම, ගුරුදේව වන්නම හා ආනන්ද වන්නම.
(3) යශෝදරා වන්නම, සමනල වන්නම, මහ බෝ වන්නම.
(4) මරඟන වන්නම, හංස වන්නම, ගුරුදේව වන්නම.
(5) ආනන්ද වන්නම, මහබෝ වන්නම, මරඟන වන්නම. (.........)

20. ' තාල කාල ක්‍රියාමානම්' ක්‍රියාවෙහි කාලය මැනීම තාලය ලෙස නිර්වචනය කොට ඇත්තේ,
(1) භාරත මුණිවරයාගේ 'නාට්‍ය ශාස්ත්‍රයෙහි' ය
(2) අභිනවගුප්ත ආචාර්යයන් ගේ 'අභිනව භාරතී' ග්‍රන්ථයෙහි ය.
(3) ඇරිස්ටෝටල් ගේ 'කාව්‍ය ශාස්ත්‍රයෙහි 'ය.
(4) සාරංගදේව පඬිතුමාගේ 'සංගීත රත්නාකරය' ග්‍රන්ථයෙහි ය.
(5) අමරසිංහ ආචාර්යයන් ගේ 'අමරකෝෂ' ග්‍රන්ථයෙහි ය. (.........)

21. ක්‍රි. ව. 1930 දශකයේ ඉන්දියානු ආභාසය සහිතව නිෂ්පාදනය වූ නෘතය නාටක දෙක වනුයේ,
 (1) සීතාහරණ සහ නල දමයන්ති (2) සීතාහරණ සහ ෂද්දන්තළායම්
 (3) මනෝහර බන්ධනම් සහ නල දමයන්ති(4) ඌර්වෂිජායම් සහ ශිවරංග
 (5) සීතාහරණ සහ මනෝහර බන්ධනම් (.........)



(1)



(2)

22. ඉහත රූපයන්හී දැක්වෙන බැලේ රංගනයන් වනුයේ,
 (1) හංසවිල හා ද වෙඩින් (2) ද වෙඩින් සහ නට් ක්‍රැකර්
 (3) නිදි කුමරිය හා හංසවිල (4) නට් ක්‍රැකර් හා නිදි කුමරිය
 (5) හංසවිල හා ද වෙඩින් (.........)

23. කථ කලි නර්තන සම්ප්‍රදාය බිහිවීමෙහිලා මුල් වූ ජන නාටක වන්නේ,
 (1) රාමාට්ටම්, කුච්චි ආට්ටම්, අට්ඨකථා ය.
 (2) කුච්චි ආට්ටම්, ක්‍රිෂ්ණාට්ටම්, බාන යුද්ධ ය.
 (3) චක්කියාර්කුත්තු, ඔට්ටම් තුල්ලල්, රාමානාට්ටම් ය.
 (4) කුඩියාට්ටම්, චක්කියාර්කුත්තු, රාමානාට්ටම් ය.
 (5) ක්‍රිෂ්ණාට්ටම්, බාන යුද්ධය, කුඩියාට්ටම් ය. (.........)

24. ලක්නම් ඝරාණාවේ ප්‍රවීන කථක් නර්තන ශිල්පීන් ලෙස කටයුතු කරන ලද්දේ,
 (1) දුර්ගා ප්‍රසාද් සහ අච්චන් මහරාජ් (2) අච්චන් මහරාජ් සහ බිර්ජු මහාරාජ්
 (3) ක්‍රිෂ්ණ අයියර් සහ සුන්දර් ප්‍රසාද් (4) දුර්ගා ප්‍රසාද් සහ බිර්ජු මහාරාජ්
 (5) අච්චන් ප්‍රසාද් සහ ක්‍රිෂ්ණ අය්යර් (.........)

25. දේශීය ලාක්ෂා කර්මාන්තය යොදා ගනිමින් අලංකාර කොට ගෙන ඇති උපකරණ වන්නේ,
 (1) සේසත්, චාමර, උඩැක්කි (2) ගැටබෙරය, උඩැක්කිය, චාමර
 (3) තම්මැට්ටම, බටනළාව, උඩැක්කිය (4) කුඩ, චාමර, රබාන
 (5) උඩැක්කිය, තම්මැට්ටම, දවුල (.........)

- **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. තම්මැට්මේ මණ්ඩම හා හඬබෑය සම්බන්ධ කෙරෙන වරපට ගෙතුම හඳුන්වන්නේ ....................................... ලෙසටය.

27. ............................................... හිමියන් විසින් බලි ශාන්ති කර්මයට බෞද්ධ මුහුණුවරක් දුන් බව කියැවේ.

28. කිරි මැස්ස සහ මල් යහනාව .......................................... ශාන්ති කර්මයේ දක්නට ලැබෙන සැරසිලි වේ.

29. බෙර වාදනයේ දී වෙනත් අක්ෂර සම්බන්ධ කොට ගෙන උපදවන අවනද්ධාක්ෂර .................................. නම් වේ.

30. වලියකුම ශාන්ති කර්මයේ දී ගරායකුම නැටීම ............................................... කුලයේ අය විසින් කළ යුතු රාජකාරියක් සේ සැලකේ.

31. ' අත් උරින් පහතින වෙත් සුරන් සිරුරින' මෙය .............................................. වන්නමෙහි එන කවි පදයකි.

32. ආලෝකකරණයේ දී භාවිතවන මූලික වර්ණ තුන වන්නේ රතු, කොළ සහ ........................................... වර්ණයයි.

33. අපගේ මුණි රජාණන් ..... මෙහි ලඝු, ගුරු මාත්‍රා සංඛ්‍යාවෙහි එකතුව ....................................................... කි.

34. හිසේ සිට දෙපතුල දක්වා දෝෂ දුරු කිරීම සඳහා ...................................................... කවි ගායනා කරනු ලැබේ.

35. සොකරි නාටකයේ .......................................................... නම් චරිතය කොළපත් වෙස් මුහුණක් පැළැඳ රංගනයේ යෙදේ.

- **අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර තිත් ඉර මත ලියන්න.**

36. දේශීය අවනද්ධ භාණ්ඩ දෙකක් වන තම්මැට්ටම හා උඩැක්කිය හඳුන්වන වෙනත් නාම දෙකක් සඳහන් කරන්න.

    1. තම්මැට්ටම　　: .......................................................

    2. උඩැක්කිය　　: .......................................................

37. තාක්ෂණයත් සමඟ ඉදිරියට යන අංග රචනා ක්ෂෙත්‍රය තුළ නවීනතම අංග රචනා ක්‍රම දෙකක් වේ. ඒවා නම්,

    1. ...................................................　　2. ...................................................

38. සබේ විදානේ සහ පොතේ ගුරු යන චරිත හමුවන ජන නාටක මොනවා ද?

    1. සබේ විදානේ　　: ...................................................

    2. පොතේ ගුරු　　: ...................................................

39. දකුණු ඉන්දියානු කර්ණාටක තාල පද්ධතියෙහි තාල හා ජාති සංඛ්‍යාත්මකව දක්වන්න.

    1. තාල　　: ...................................................

    2. ජාති　　: ...................................................

40. දේශීය ජන ගී හා සුවිශේෂීව යොදා ගනු ලබන ආතත ගණයට වැටෙන අවනද්ධ භාණ්ඩ දෙක සඳහන් කරන්න.

    1. ...................................................　　2. ...................................................

41. හත් අඩියේ කවි සහ හිං හතරේ කවි අන්තර්ගතවන ශාන්තිකර්ම මොනවා ද?

1. හත් අඩියේ කවි : ........................................................

2.හිං හතරේ කවි : ........................................................

42. කච්චකෙට්ට අභ්‍යාසම් වලට සහ තත්කාර් අභ්‍යාස සිදු කෙරෙන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

1. කච්චකෙට්ට අභ්‍යාසම් : ........................................................

2. තත්කාර් අභ්‍යාස : ........................................................

43. රොබට් නොක්ස් විසින් ලංකාව සම්බන්ධව රචනා කරන ලද ග්‍රන්ථය සහ එය අයත් යුගය සඳහන් කරන්න.

1. ග්‍රන්ථය : ........................................................

2. අයත් යුගය : ........................................................

44. රුසියාවේ බැලේ රංග කලාව වර්ධනය කිරීමට දායක වූ රජු සහ එහි සුප්‍රසිද්ධ රඟහල ලියා දක්වන්න.

1. රජු : ........................................................ 2. රඟහල : ........................................................

45. භරත මුණිවරයා විසින් දක්වා ඇති නාට්‍ය ශෛලීන් දෙක නම් කරන්න.

1. ........................................................ 2. ........................................................


46. භරත නාට්‍යයම් සංදර්ශනයක රංග අනුපිළිවෙලෙහි ප්‍රථම සහ අවසාන අංග දෙක මොනවා ද?


1. ........................................................ 2. ........................................................

47. අංගම් සටන් කලාව ඇසුරින් නිර්මාණය වූ ගැමි නැටුම කුමක් ද? අතීතයේ එම නැටුම පැවති බවට සාධක ඇති ස්ථානය කුමක් ද?

1. ගැමි නැටුම : ........................................................

2. ස්ථානය : ........................................................


(1)


(2)

48. ඉහත රූපවලින් නිරූපිත සැරසිලි මොනවා ද?

1. ........................................................ 2. ........................................................

49. කරගම් හා කාවඩි යන ජන නැටුම් හා සම්බන්ධ දෙවිවරුන් වන්නේ,

1. ........................................................ 2. ........................................................

50 අද්භූත සහ වීර රසයට මුල්වන භාව මොනවාද ?

අද්භූතඃ ........................................................ වීර රසයඃ ........................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 13 - 2023**

විභාග අංකය: ....................................

# 52 නර්තනය ( දේශීය ) - II

**කාලය පැය 03 යි**

- I - කොටසේ ප්‍රශ්න දෙක අනිවාර්ය වේ.
- II හා III - කොටස්වලින් ද ඇතුළත් වනසේ ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
- උපදෙස් :- සෑම ප්‍රශ්නයකම I හා II කොටසට ලකුණු 06 බැගින් ද, III කොටසට ලකුණු 08 බැගින් ද ලකුණු 20ක් හිමිවේ.

## I - කොටස

01. (i) දොං ජිජිගත ජිං කුඳගත - යන බෙරපදය මාත්‍රා තුනේ තාලයට ප්‍රස්ථාර කරන්න.

(ii) පහත සඳහන් කවි පදය තුන් සුළු දෙමහ පස්තිතේ තාල රූපයට ප්‍රස්ථාර කරන්න.
' බුද්ධ රාජය වැන්දේ පළමුව, දෙවනු සද්ධර්මය වදිමි'

(iii) උකුසා වන්නමේ අඩව්ව මහ තනිතිතට ප්‍රස්ථාර කරන්න.

02. දේශීය නර්තන කලාව විකාශයේදී එක් එක් යුගවලට විවිධ වූ සංස්කෘතික ලක්ෂණ බලපා ඇති බව මූලාශ්‍ර මගින් හෙළිවේ.

(i) අතීතයේ වෘත්තීය නර්තන කලාවක් පැවති බව පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) කොහොඹාකංකාරිය පිළිබඳ කියවෙන තොරතුරු ඇතුළත් මූලාශ්‍ර දෙකක් සාධකය සහිතව දක්වන්න.

(iii) ක්‍රි. ව. 1930 - 1960 දක්වා කාල පරාසයේ දී දේශීය නර්තනය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ විකාශණය විය. සාධක 4ක් දක්වමින් විමසන්න.

03. දේශීය ශාන්තිකර්ම සුවිශේෂ අනන්‍යතාවයන්ගෙන් හා කලාත්මක ලක්ෂණ වලින් උපලක්ෂිත වේ.

(i) රටයකුමේ නානුමුරය රඟ දක්වන ශිල්පියාගේ කලා කෞශල්‍ය ප්‍රදර්ශනය වන ආකාරය අගයන්න.

(ii) සමාජ සම්බන්ධතා මත කළගුණ සැලකීමේ අවශ්‍යතාව ඌරායක්කමෙන් ප්‍රතීයමාන වේ. උදාහරණ දෙමින් විස්තර කරන්න.

(iii) පහන්මඩුවේ එන පොත්කඩේ යක්කම සුවිශේෂී නාටකීය ලක්ෂණ වලින් සුපෝෂිත වේ. විමසන්න.

04 ඇදහිලි හා විශ්වාස මත පදනම් වු ශාන්තිකර්ම මගින් තත්කාලීන සමාජ සංස්කෘතික පසුබිම පිළිබිඹු කරයි.

(i) සමාජ සාරධර්ම සහ සහජීවනය වර්ධනයට කිරිමඩුව පැවැත්වීමෙන් ලැබෙන වටිනාකම් පිළිබඳව විග්‍රහ කරන්න.

(ii) සන්නියකුම ශාන්තිකර්මයේ යක්ෂ චරිත නිරූපනයේ ඇති විශේෂතා පිළිබඳව විස්තර කරන්න.

(ii) බලි ශාන්ති කර්මයේ සැරසිලි ක්‍රම සෙසු ශාන්තිකර්ම වලට වඩා වෙනස් මුහුණුවරක් ගනී. පැහැදිලි කරන්න.

05. දේශීය ගැමි නැටුම් හා ගැමි නාටක ජන ජීවිත කියාපාන කැඩපතකි.

(i) ගැමි නැටුම් දෙකක් ඇසුරෙන් ඉහත පාඨය සනාථ කරන්න.

(ii) නොංචි කෝළම මගින් ගෙනහැර පාන සමාජ විවරණය පිළිබඳව විමර්ශනාත්මකව කරුණු දක්වන්න.

(iii) ද්‍රවිඩ ගැමි නැටුම්වලින් ඔවුනගේ ආගමික පසුබිම ප්‍රදර්ශනය වන අයුරු නැටුම් තුනක් මගින් විමසුමට ලක් කරන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| නිදි කුමරිය | ශ්‍රීමතී මේනකා | චන්ඩාලිකා |
| හංස විල | රුක්මණී දේවි ආරුන්ඩේල් | පටාචාරා |
| ද වෙඩින් | බාලා සරස්වතී | බැරිසිල් |
| නට් ක්‍රැකර් | ගලීනාඋලනෝවා | නල දමයන්ති |

06. (i) (අ) කොටසෙහි අවුරෝරා කුමරිය සම්බන්ධ බැලේ නාට්‍ය තෝරා එහි සංචලන හා සංගීත යොදාගෙන ඇති අයුරු පැහැදිලි කරන්න.

(ii) (ආ) කොටසෙහි අධ්‍යාර්හි කලා ක්ෂේත්‍රයට වඩාත් මෙහෙවරක් කළ ශිල්පිනිය තෝරා ඇය පිළිබඳ ඇගයීමක් කරන්න.

(iii) දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන හාස්‍ය හා උපහාසය යොදා ගනිමින් නිර්මාණාත්මකව ඉදිරිපත් කරන ආකාරය විස්තර කරන්න.

07. අද්‍යතන නර්තන නිර්මාණ සමාජ රුචිකත්වය මත නිර්මාණය වීම සුලබව දක්නට ඇත.

(i) සංගීත ප්‍රසංගවල ගීත හා නර්තන සුසංයෝගයේදී සංගීතයට වඩා සංචලනවලට ප්‍රමුඛතාවක් ලබා දී ඇති බව පෙනේ. විමසන්න.

(ii) රූපවාහිනී රියලිටි නර්තන වැඩසටහන් තරුණ පරපුරේ නිර්මානශීලිත්වය සංවර්ධනයට රුකුලක් වී තිබේ ද? යන්න විග්‍රහ කරන්න.

(iii) සාම්ප්‍රදායික නර්තන සංරක්ෂණය කිරීමෙහි ලා රූපවාහිණී මාධ්‍ය පිටුවහලක් කර ගත හැකි ආකාරය විමසුමට ලක් කරන්න.

08. නූතන වේදිකාව සහ සාම්ප්‍රදායික රඟමඩල තුළ විවිධ වෙනස්කම් දැකිය හැකිය.

(i) නූතන වේදිකාවේ දක්නට ලැබෙන නිර්මාණාත්මක රංග වස්ත්‍රාභරණ නර්තනයේ ප්‍රාසාංගික බවට කෙතරම් ඉවහල් වන්නේදැයි කරුණු දක්වන්න.

(ii) සාම්ප්‍රදායික රඟ මඩලේ රංගභූමි අලංකරණයේ දී භාවිතා වන අමුද්‍රව්‍ය හා සැරසිලි පිළිබඳ ඇගයීමක් කරන්න.

(iii) නූතන වේදිකා ආලෝකකරණය හා ශාන්තිකර්ම මඩු ආශ්‍රිත ආලෝකකරණය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තුන්වන වාර පරීක්ෂණය 2023
# නර්තනය ( දේශීය)

**13 ශ්‍රේණිය** **I කොටස** **පිළිතුරු පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1 ) | 02. ( 3 ) | 03. ( 2 ) | 04. ( 5 ) | 05. ( 3 ) | 06. (4 ) | 07. ( 2 ) | 08. ( 4 ) | 09. ( 5 ) | 10. (1 ) |
| 11. ( 3 ) | 12. ( 2 ) | 13. ( 5 ) | 14. ( 1 ) | 15. ( 5 ) | 16. ( 5 ) | 17. ( 3 ) | 18. ( 4 ) | 19. ( 1 ) | 20. (5 ) |
| 21. ( 2 ) | 22. ( 4 ) | 23. ( 3 ) | 24. ( 2 ) | 25. ( 1 ) | | | | | |

26. කුන්දිරම් පල්ල
27. වීදාගම
28. කිරිමඩුව
29. සංයුක්තාක්ෂර
30. ඔළී
31. ගණපති
32. නිල්
33. 08 ( අට)
34. සිරසපාද
35. පරයා
36. පොකුරු බෙරය / සිරිවස
37. එයාර් බ්‍රෂ් / ප්‍රොස්තටික්
38. කෝලම් / නාඩගම්
39. 07 යි / 05 යි
40. අත් රබාන / උඩැක්කිය
41. සූනියම් ශාන්තිය / බලි ශාන්ති කර්මය
42. කථකලි / කථක්
43. එදා හෙළ දිව / මහනුවර යුගය
44. මහා පීටර් / බොල්ෂෝයි
45. ලෝක ධර්මී / නාට්‍ය ධර්මී
46. අලාරිප්පු / ශ්ලෝකම්
47. ලී කෙළි / ඇම්බැක්කේ දේවාලය
48. රටයකුම් වීදිය / අයිලය
49. අයියනාර් / මුරුගන්
50. විශ්මය / උත්සාහ

ලකුණු ප්‍රදානය :

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 ට = 02 x 50

මුළු ලකුණු = 100

## II පත්‍රය -I කොටස

01. (i)

| / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - | ජී | ජී | ග | ත | ජීං | - | කු | ද | ග | ත |

(ii)

| ^ 1 | 2 | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | බුද් | - | ධ | - | රා | - | - | - | ජ | - |ය | - |
| + | + | වැන් | - | දෙ | - | ප | - | ල | - | මු | - | ව | - |
| + | + | දෙ | ව | නු | - | ස | - | - | ද් | ධ | - | - | ර් |
| + | + | ම | ය | ව | - | දි | - | - | - | - | - | - | ම් |

(i) හා (ii) කොටසට නිවැරදි ආවර්ථ සහ නිවැරදි තාල සංඥා ඇත්නම් (ල. 02) පද ප්‍රස්ථාරයට (ල. 04) මුළු ලකුණු 6 බැගින්

(iii)

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | කඩ | තරි | කිට | ජි | ජි | කු | ද | තෙ | හිං | - | තෙ | හිං | ත | කු | ද |
| තෙ | හිං | තත් | කඩ | ජිත් | කඩ | කඩ | තක | ගජ් | - | ජිත් | - | - | - | කඩ | තක |
| ත | ක | ජිත් | - | - | - | කඩ | තක | ත | කුං | - | ත | කුං | - | ජිත් | - |
| ත | කුං | - | ත | කුං | - | ජිත් | - | ජි | ග | ත | කු | ත | ක | තෙ | හිං |
| තා | - | තත් | කඩ | ජිත් | කඩ | කඩ | තක | ජි | ග | ත | කු | ත | ක | තෙ | හිං |
| තා | | | | | | | | | | | | | | | |

නිවැරදි ආවර්ථ සහ නිවැරදි තාල සංඥා ඇත්නම් (ල. 02) (මුළු ලකුණු 20)

පද ප්‍රස්ථාරයට (ල. 06) මුළු ලකුණු 8 බැගින්

(2) I ★ සිතුල් පව්ව කොරවක්ගල සෙල්ලිපිය
★ සැස්සේරුව සෙල්ලිපිය
★ පාලමොට්ටායි සෙල්ලිපිය ............ආදී මූලාශ්‍ර 2 ක් සාධකය සමග ලියා ඇත්නම්....
මූලාශ්‍ර නම් කිරීමට - 02
වෘත්තීය කලාවක් පැවති බවට තහවුරු කිරීමට - 04 මුළු ලකුණු 06 යි.

II ★ කුවේනි අස්න - කෝට්ටේ යුගයේ vi වන පරාක්‍රමබාහු රජතුමන් යසස පතා කොහොඹාකංකාරි ශාන්තිකර්මයක් කළ බව.
★ සිහබා අස්න - ශ්‍රී වීර පරාක්‍රමනරේන්ද්‍රසිංහ රජුට සෙත් පතා කොහොඹාකංකාරියක් කළ බව.
මූලාශ්‍ර නම් කිරීමට - 02
සාධක විස්තර කිරීමට - 04 මුළු ලකුණු 06 යි.

III ★ 1930 ගණන්වල චන්ද්‍රලේඛා නමින් උසස් සමාජ සම්මත කාන්තාවක් නර්තන කලාවට පිවිසීම.
★ 1934 රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ පැමිණීම හා ඇති වූ කලා ප්‍රබෝධය.
★ 1936 ගාන්ධර්ව විභාග ක්‍රමය ඇතිවීම.
★ 1940 දශකයේ මුද්‍රානාට්‍ය කලාව ආරම්භ වීම.
★ 1943 පාසල්වල නර්තන විෂය ඉගැන්වීම.
★ 1945 නර්තන විෂය සඳහා පරීක්ෂකවරයෙකු පත් කිරීම.
★ 1953 රජයේ ලලිතකලායතනය ආරම්භ කිරීම.
★ 1956 සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ කිරීම.
සාධක විස්තර කර ඇත්නම් - ලකුණු 08 යි. (මුළු ලකුණු 20)

## II පත්‍රය - II කොටස

(3) I ★ නානුමුරයේ රූපණ අවස්ථා ඉස්මතු වී ඇති ආකාරය විස්තර කිරීම.
★ ඇදුරා රිද්දි බිසවින්සේ සමාරෝපය වෙමින් නානුමුරයේ අවස්ථා අනුකරණාත්මකව ඉදිරිපත් කිරීම.
★ කාන්තාවකගේ භාවාත්මක හැඟීම් උද්දීපනය කරන අයුරින් නාරි ලාලිත්‍යයෙන් නර්තන ඉදිරිපත් කිරීම. උදා: හිස පීරීම, නානු ගෑම, සළු පැළඳීම..........
★ රංගභාණ්ඩ කලාත්මකව සකස් කිරීම සිදුකරන බවත්, එය ශිල්පියාගේ කලා හැකියාමත සිදුවන බවත් දැක්වීම. කරුණු 3ක් ඔස්සේ ඇගයීමට ලක්කර ඇත්නම් - ලකුණු 06

II ★ විවිධ කුලගෝත්‍ර අනුව ඌරාගේ කොටස් බෙදන ආකාරය කවි වලින් උදාහරන දක්වා තිබීම.
★ බෙරපද, කවිගායනා මගින් නාට්‍යමය අවස්ථාවක් ලෙස ඉදිරිපත් වන බව
කළගුණ සැලකීම පිළිබඳව ඇතුලත්ව උදාහරණ දෙමින් කරුණු දක්වා ඇත්නම් - ලකුණු 06

III ★ ප්‍රධාන ඇදුරා සහ දවුල් වාදකයා අතර සංවාද මගින් නාට්‍ය රසය ඉස්මතු වන බව.
★ බුලතා සහ බැඳි සිද්ධියක් හාස්‍යයෝත්පාදකව ඉදිරිපත් කර බව.
★ ගොයම හා සම්බන්ධ රෝග ස්ත්‍රීන්ට වැළදෙන රෝග බව ප්‍රකාශ වීමෙන් හාස්‍ය රසය තව තවත් උද්දීපනය කෙරෙන බව. විස්තර කර ලියා ඇත්නම් ලකුණු 08 (මුළු ලකුණු 20)

(4) I ★ සාමුහිකත්වයෙන් සහ සහයෝගයෙන් ගමේ පොදු යහපත උදෙසා එකමුතුව වැඩ කරන බව.
★ කිරි ඉතිරීවීම මූලිකව කෙරෙන බව
★ කිරි උතුරුවා ගව පට්ටි වලට ඉසීමෙන් සෞභාග්‍ය ළඟාකර ගත හැකි යයි විශ්වාස කරන බව.
★ නාට්‍යානුසාරයෙන් කුඹුරු කෙටීමේ සිට අස්වනු නෙළීම දක්වා ඉදිරිපත් කරන බවත් එම සහලින් දෙවියන්ට දානය දීමෙන් සශ්‍රීකත්වය අපේක්ෂා කරන බවත් දැක්වීම.
★ මෙහිදී කිරි රොටී දානයද සුවිශේෂී අවස්ථාවක් බව.
★ පැමිණි සියළුම දෙනාට රොටී පිළිගැන්වීමෙන් සාමූහිකත්වය, සහජීවනය, සමගිය හා උස්පාත් භේදයකින් තොරව සියළුම දෙනා සමව සලකන බව.
ආදී ලෙස කරුණු 3ක් වත් දක්වා ඇත්නම් - ලකුණු 06

II ★ කළු යකා, ඊරි යකා, සූනියම් යක්ෂණිය, අතිමාන යකා, සන්නි 18 හි මුහුණුවල විවිධත්වය හා චරිත නිරූපනයට එය ඉවහල් වන බව.
★ වෙස්මුහුණුවල හැඩය, වර්ගය හා ඇඳුම්වල වර්ගය චරිතයට ඉවහල් වන බව.
★ සූනියම් යක්ෂණියතේ අනස්ථා 3.
i. තරුණිය ii. ගැබිණි කාන්තාව iii. දරුවා හා මව - ආදි ලෙස විස්තර කර තිබිම.

- ⋆ මරුසන්නියකාගේ රක්තවර්ණ ඇස් දළ සහිත කලුවන් මුහුණ කලුවන් කෙස් සහිත ඇඳුම් පැළඳුම් පිළිබඳ දක්වා තිබීම.
- ⋆ සංවාද භාවිතය. චරිත නිරූපනයේදී ප්‍රබල වන බව
- ⋆ සතර අභිනය භාවිතා වන බව. කරුණු 3 ක් විස්තර කිරීමට ලකුණු - 06

**III** ⋆ මල් බුලත් තටුව සකසා ගැනීම ⋆ පුන් කලස් තැබීම
- ⋆ බුලත් කොළ තැබීම ⋆ මැටි පහන් දැල්වීම
- ⋆ නව ග්‍රහයින් සඳහා නියමිත වෘක්ෂවල කොළ වර්ග වලින් බලි මඩුවේ උඩුවියන අලංකාරව සකස් කර ගන්නා බව.
- ⋆ මැස්සක් තනා හුබස් මැටියෙන් බල්රූප සකස්කර ගැනීම සිදු කරන බව.
- ⋆ ඇතැම් බල්රූප රෙදි කඩක් මත චිත්‍රණය කිරීම.
- ⋆ ස්වභාවික යුෂගෙන බලියට අදාල වර්ණ සංකලණය කර ගන්නා බව. කරුණු 4 ක් විස්තර කිරීමට ලකුණු - 08 (මුළු ලකුණු 20)

(5) **I** ⋆ ගැමි නැටුම් දෙකක් තෝරා ගැනීම
- ⋆ සමාජ විශ්වාස, ඇදහිලි හා ජීවනෝපායමාර්ග නර්තන තුළ ගැබ් වී ඇති බව.
- ⋆ ජීවන වෘත්තීන් හා බැඳී ගායනා භාවිතා වන බව
- ⋆ වෘත්තීන් හා බැඳි රිද්ම රටා පාදක වී ඇති බව
- ⋆ සරල බව හා සමාජ සහජීවනය
- ⋆ වෘත්තීන් හී සම්භවය
- ⋆ ජීවන රටාව පිළිබිඹු වන අයුරු දැක්වීම ......ආදී ලෙස කරුණු 4ක් දැක්වීම ලකුණු 06

**II** ⋆ වයස පෙන්වීමට අකමැති බව ප්‍රදර්ශණය වන බව
- ⋆ නිතරම තරුණ කාන්තාවක් සේ හැසිරීමට උත්සාහ දරණ බව හා ඇගේ ක්‍රියාකලාපයන් හාස්‍යයට හා උපහාසයට ලක්කර ඇති බව.
- ⋆ ඇඳුම් පැළඳුම්වලින් වයස්ගත බව පෙන්වීම හැට්ටයට යටින් පියයුරු එල්ලෙන සේ සකස්කර තිබීම.
- ⋆ පවුල් සංස්ථාවේ නොසන්සුන්කම හා වගකීම් තෙරුම් නොගන්නා බව.
- ⋆ වෙනත් පිරිමින් දුටුකල වැඩි ඇගෑළුම් කම් පෙන්වීම, ආදී චරිත ලක්ෂණ ඉදිරිපත් කරන බව.
- ⋆ බීමත් කම නිසා රාජකාරී පැහැර හරින බව
- ⋆ ස්වාමියාගේ බීමත්කම නිසා කාන්තාවන් අපහසුතාවයට පත්වන බව

......ආදී ලෙස කරුණු 4ක් දැක්වීම ලකුණු 06

**III** ⋆ ද්‍රවිඩ ගැමි නැටුම් වන පින්නල් කෝලාට්ටම් නැටුම කෝවිල් පූජා උත්සව අතර බහුලව භාවිත වන බව.
- ⋆ කාවඩි නැටුම මුරුගන් දෙවියන් වෙනුවෙන් කරන භක්ති නර්තනයක් බව
- ⋆ කාවඩි කුඩුව ශිවගිරි හා සප්ත ගිරි කඳු සංකේතවත් වන අතර එම සිදුවීම කතරගම දෙවියන් හා බැඳී පවතින බව
- ⋆ කරගම් නැටුම දේව භක්තිය ප්‍රකාශ වන බව
- ⋆ දෙවියන්ගේ ලෙඩ වලින් ආරක්ෂා වීම සඳහා කරගම් නැටුම සිදුකරන බව

......ආදී ලෙස කරුණු 4ක් දැක්වීම ලකුණු 08

## II පත්‍රය - III කොටස

(6) **I** (අ) - නිදි කුමරිය
- ⋆ රොමැන්ටික් බැලේ ආකෘතියෙන් නිර්මාණය වුවක් බව
- ⋆ බටහිර සංගීතයට අනුව සංචලන ඉදිරිපත් කරන බව
- ⋆ රංග වින්‍යාසය මාරියස් පෙටිපා විසින් කළ බව
- ⋆ කුමරිය විසින් ස්වයංවර අවස්ථාවේ කුමරුන් 4 දෙනා සමග Rare A day සද නැමැති ඉතා අලංකාර වුත් සංකීර්ණ වූත් නර්තනයක් ඉදිරිපත් කිරීම

II ★ ක්‍රි. ව. 1936 දී චාදම්බරම් දේවාලයේ නටරාජා වෙනුවෙන් පූජා නර්තනයක් කළ බව
★ ඇනා පැව්ලෝවාගෙන් බැලේ නර්තන කලාව හදාරා ඇති බව
★ නව ආකාරයක චිත්තාකර්ෂනීය රංග වස්ත්‍රාභරණ හා ආභරණ සොයාගත් බව
★ භරත නර්තනය ඉගැන්වීම සඳහා අඩයාර්හී කලාක්ෂේත්‍ර ආයතනය ආරම්භ කළ බව
★ රාධා, ක්‍රිෂ්ණ, රාම්ලීලා වැනි නෘත්‍ය නාට්‍ය නිර්මාණය කළ බව
★ 1956 දී පද්මභුෂණ සම්මානයෙන් පිදුම් ලැබූ බව

ඉහත කරුණු අනුව විස්තරකර ඇත්නම් ලකුණු 06

III බැරිසිල්
★ සිල් සමාදන් වූ උපාසිකාවන් අතින් සිදුවන ක්‍රියාකාරකම් වල දක්නට ලැබෙන අඩුපාඩු උපහාසාත්මකව විචාරය කරන බව
උදා - ඇනුම් ඇරීම, හිරි ඇරීම, මදුරුවන් තැලීම, ඕපදූප කීම
★ සමාජ යථාර්ත ස්වභාවයන් මතුකර දක්වන බව
★ දේශීය නර්තන ශෛලීන් අනුකරණාත්මකව චරිත වලට යොදා ගැනීම.
★ පහතරට වාදන හා නර්තන යොදා ගැනීම (මුළු ලකුණු 20)

(7) I ★ ගීතයේ අදහසට වඩා රිද්මයට හා තාලානුකූල බවට ප්‍රධාන තැනක් හිමිවන බව
★ ගීත නර්තනවල අර්ථ විරහිතව යොදාගත් චලන දක්නට ඇති බව
★ බටහිර සංගීත භාණ්ඩ බහුලව යොදාගෙන ඇති බව
★ ගීතයේ සංචලන දේශීයත්වයට වඩා බටහිර මුහුණුවරක් ගැනීම

....වැනි කරුණු විස්තර කර ඇත්නම් ලකුණු 06යි

II ★ රියලිටි වැඩ සටහන් නම්කර තිබීම
★ රංග වස්ත්‍රාභරණ හා පසුතල නිර්මාණ
★ විදුලි ආලෝකය
★ පෙර අපර දෙදිග සංචලන හා සංගීතය...............යනාදී කරුණු නර්තන වැඩ සටහන් තුළින් දක්වා ඇත්නම් ලකුණු - 06

III★ ජාතික සංස්කෘතික උරුමයන් එළි දැක්වීම
★ නර්තනයේ සුවිශේෂී අවස්ථා සමීප හා දුරස්ත රූප මගින් මතු කිරීම
★ අභාවයට යමින් පවතින ශාස්ත්‍රීය නර්තන කොටස් භාවිතය තුළින් ජනප්‍රියත්වය ඇති කිරීම
★ සාම්ප්‍රදායික නාදමාලා, ශාස්ත්‍රීය පද කොටස්, ඇඳුම් කට්ටල, රංගභාණ්ඩ භාවිතය පිළිබඳ දැනුවත් කිරීම
★ රූගත කළ රූපවාහිණී වැඩ සටහන් ශ්‍රව්‍ය දෘශ්‍ය සංයුක්ත තැටි මගින් ගබඩා කර නැවත ඉදිරිපත් කිරීමේ හැකියාව ඇතිබව .......... ..යනාදී කරුණු 4ක් විචාරයට ලක්කර ඇත්නම් ලකුණ - 08
දැනුවත් කරීම

(8) I ★ විචිත්‍ර වූ වර්ණ භාවිතය
★ රංග වස්ත්‍ර හා ආභරණ භාවිතය
★ පෙර අපර දෙදිග හැඩතල, මෝස්තරවල ආභාසය
★ හිස් පළඳනා භාවිතය ..........ආදී කරුණු දක්වා ඇත්නම් ලකුණ - 06

II ★ පරිසරයේ නිර්මිත ස්වභාවික අමුද්‍රව්‍ය භාවිතා වන බව
★ කැටයම් කලාව ප්‍රබල ලෙස යොදාගෙන ඇති බව
★ වීදි, තොරං, පිදේනි තටු, කත්තිරික්ක, මල්යහන් ආදී ලෙස නම්කර තිබීම
★ රූප සටහන් ඇඳ ඉදිරිපත් කිරීම........ආදී කරුණු දක්වා ඇත්නම් ලකුණ - 06

III★ නූතන ආලෝක - තිත් පහන් , ධාරා පහන්, පරිභ්‍රමණ ලාම්පු අල්ට්‍රා වයලට් ලාම්පු, රසදිය වාෂ්පී ලාම්පු .........ආදී ලෙස
★ ශාන්තිකර්ම ආලෝක- කොප්පරා පන්දම්, අත් පන්දම්, පොල් පන්දම් පහන්, විලක්කු,කැකුන පන්දම් .........ආදී භාවිතා කල බව
★ 19 වන සියවසේ ප්‍රසංග වේදිකාවේ සංවර්ධනයත් සමග ආලෝකය වර්ගීකරණය වී නූතන වේදිකාවට එක් වූ බව
★ ආලෝක තීව්‍රතා පාලකය යොදා ගත් බව
★ අස්නේ, යක් අදුම්, පන්දම් පද වැනි නර්තන අවස්ථා මෙන්ම යහන් . වීදි හා තොරන්වල ආලෝකයෙන්ද රග මඩල ආලෝකමත් වන බව
සංසන්දනාත්මකව විග්‍රහ කර ඇත්නම් ලකුණු -08 (මුළු ලකුණු 20)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

## 52 නර්තනය ( දේශීය )

## ප්‍රායෝගික පරීක්ෂණය

| අංක | පරීක්ෂණ අයිතමය | | ලකුණු |
|---|---|---|---|
| 01 | ගායනය | I කැමති ගායනයක්<br>II නානුමුරය,නෙළුම් කවි, ප්‍රශස්ති, හටන්<br>III සුවිසි විවරන, කරත්ත, කඩතුරා, වරම්<br>VI නමස්කාරයක්, පාරු කවියක්, කරත්ත කවියක්, පහන් කවියක් -ගුරු අභිමතය පරිදි 1 බැගින් ගන්න. | 5 x 4<br>20 |
| | තාල අවබෝධය | I ගොග් ගොග් ජිං ජිංගත වට්ටමේ / හෝ 2 අඩව්ව තාල තබා කීම.<br>II කුදංත ගත දොං / කුදකුජිගත/ දොං ජිංත ගත දොංත 1-3 දක්වා පදය, කස්තිරම, අඩව්ව. ගුරු අභිමතය පරදි 1 ක් පමණක් ගන්න | 20 |
| 03 | කැමති නර්තනය | ඔබ ඉගෙනගන්නා නර්තන සම්ප්‍රදායේ විෂය නිර්දේශට අයත් ශිල්පීය ප්‍රාගුන්‍ය දැක්විය හැකි ශාස්ත්‍රීය නර්තනයක් | 20 |
| 04 | වෙනත් සම්ප්‍රදායකට අයත් | ශුද්ධ මාත්‍රය / මුල් මාත්‍රය | 20 |
| 05 | වන්නම් | මුසලඩි, ගණපති, මයුරා, උකුසා, ගජගා, සුරපති<br>(එක් වන්නමක් කුසපත් ඇද ලබාදෙන්න.) | 20 |
| 06 | ගායන රහිත නර්තන අංගයක් | යක් ඇනුම/ ආවැන්දුම<br>ගුරු අභිමතය පරිදි එකකින් කොටසක් ගන්න | 20 |
| 07 | පූජා භාණ්ඩ භාවිත | කොතල පදය / බුලත් පදය | 20 |
| 08 | ගායන සහිත | අස්නේ / මංගලම් | 20 |
| 09 | වාදනය | I 1 - 5 දක්වා ගුරුවරයා නම්කරන ලද සරඹයක්<br>II කැමති වන්නමක කවිය ගයමින් වාදනය කස්තිරම සමග | 20 |
| 10 | සිද්ධියක් ඇසුරෙන් චරිත නිරූපනය | අලියා, මොනරා, ගොවියා, ධිවරයා, රජතුමා, කුමරිය, ආදී වශයෙන්.<br>ගුරු අභිමතය පරිදි චරිතයක් දී නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම | 20 |


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න